# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2389/06 – 2024 ජුනි මස 17 වැනි සඳුදා – 2024.06.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2018/266

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.01.03 දිනැති හා අංක 2156/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.12.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. කෝට්ටේගොඩ, ප්‍රධාන පාර, ''ගයාෂාන්'' පදිංචි එම්. එම්. මොහාන් ඇන්තනී මයා 2. හුංගම, දකුණු බට අත පදිංචි ඊ. කේ. ඒ. සිසිර මයා, 3. තංගල්ල, දංකැටිය, සඟබෝ මාවත, අංක 29 හි පදිංචි ඩබ්. පී. ආරියදාස මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 15, මට්ටක්කුලිය, කාක දූපත පිහිටි ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A01/2020 හා 2024.04.01 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 30 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කාර්මික අධිකරණයේ දී ය.**

1. එම්. එම්. මොහාන් ඇන්තනී මයා,
   ''ගයාෂාන්''
   ප්‍රධාන පාර,
   කෝට්ටේගොඩ.

2. ඊ. කේ. ඒ. සිසිර මයා,
   දකුණු බට අත,
   හුංගම.

3. ඩබ්. පී. ආරියදාස මයා,
   නො. 29,
   සගබෝ මාවත,
   දංකැටිය,
   තංගල්ල.

*පළමු පාර්ශ්වය*

IR/COM/01/2018/266
නඩු අංකය: ඒ /01/2020

සහ

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය,
කාක දූපත,
මට්ටක්කුලිය,
කොළඹ 15.

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල

පෙනී සිටීම :-

පළමු පාර්ශ්වය වෙනුවෙන් - එස්. කේ. එස්. ජයසිංහ, නියෝජිත මහතා

දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් - නීතීඥ අකාෂ් රෆීක් මහතා ද,
ආයතනය නියෝජනය කරමින් සහකාර ලේඛකාධිකාරී දිලන්ත පෙරේරා මහතා

**බලතල පැවරීම**

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා හිටපු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතාට 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධනය වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී තිබූ බලතල ප්‍රකාරව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වන මා වෙත පවරා ඇත.

**ප්‍රදානය**

**එකී කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

| |
|---|
| "ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ (Ocean University of Sri Lanka) සේවය කරන එම්. එම්. මොහාන් ඇන්තනී, ඊ. කේ. ඒ. සිසිර සහ ඩබ්. පී. ආරියදාස යන අයට/ ඔවුන් දරන යාත්‍රාපති (Skipper) තනතුරට U-Ex-1 වැටුප් කේතයට ( Salary Code) අයත් වැටුප් පරිමාණය (Salary Scale) ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුවී තිබේ ද? අසාධාරණයක් සිදුව ඇත්නම් කුමන සහන හිමි විය යුතු ද?" යන්න පිළිබඳව වේ. |

*ආරාවුලට අදාළ පසුබිම*

1. එම්. එම්. මොහාන් ඇන්තනී

1988 වර්ෂයේ ජාතික ධීවර පුහුණු අභ්‍යාස ආයතනයේ සේවයට බැඳී ඇත. ඉන් පසුව ජාතික ධීවර පුහුණු අභ්‍යාස ආයතනය 1999 අංක 36 දරන පනත මගින් ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය බවට පත්වන අවස්ථාව වන විට ජාතික ධීවර අභ්‍යාස ආයතනයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වූ ග්‍රීසර් තනතුරේ එම්. එම්. මොහාන් ඇන්තනී යන අය සේවය කර ඇත.

පසුව 1999 අංක 36 දරන පනත මගින් පිහිටුවන ලද ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ වර්ෂ 1999.12.20 වන දින සිට යාත්‍රා ක්‍රියාකරු තනතුරට පත්වී ඇත. එම ආයතනයේ එම්. එම්. මොහාන් ඇන්තනී යන අය සේවය කරමින් සිටියදී වර්ෂ 2005.08.31 වන දින සිට යාත්‍රාපති (උපනාවික) තනතුරට උසස්වීමක් ලැබී ඇත. පසුකාලීනව මෙම තනතුරු නාමය වෙනස් වී එය යාත්‍රාපති තනතුර බවට පත් වී ඇත.

එලෙස ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ යාත්‍රාපති තනතුරට පත්වීමත් සමගම එම්. එම්. මොහාන් ඇන්තනී යන අයට කනිෂ්ඨ විධායක ශ්‍රේණි කේතයක් වන, JM1-1 වැටුප් කේතය යටතේ පළමුවන ශ්‍රේණියට අදාළ වැටුපක් ලබා දී ඇත.

ඉන් අනතුරුව වර්ෂ 2015.06.17 වන දින අනතුරුව ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය, 2014 අංක 31 දරන පනත මගින් සාගර විශ්වවිද්‍යාලය බවට පරිවර්තනය වී ඇත. ඒ අනුව ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ හිටපු සේවකයන් සාගර විශ්ව විද්‍යාලයට අන්තර්ග්‍රහණය කර ඇත.

ඒ අනුව එම්. එම්. මොහාන් ඇන්තනී යන අය දැරූ තනතුරුවලම සේවය කර ඇත. එම්. එම්. මොහාන් ඇන්තනී යන අයට යාත්‍රාපති තනතුරේම UMT1-1 වැටුප් කේතය යටතේ වැටුප් ලබා දී ඇත. එය JM1-1 වැටුප් කේතය වැනි විධායක ශ්‍රේණි වැටුප් කේතයක් නොවීය. ඒ සම්බන්ධයෙන් පාලන අධිකාරිය එම්. එම්. මොහාන් ඇන්තනී යන අය විසින් දැනුවත් කර ඇත.

ඉන් අනතුරුව සාගර විශ්වවිද්‍යාලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් හා අනුමැතිය මත එම්. එම්. මොහාන් ඇන්තනී යන අයට යාත්‍රාපති තනතුරේම JM1-1 වැටුප් කේතය යටතේ වැටුප් ලබා දී ඇත.

නමුත් එම්. එම්. මොහාන් ඇන්තනී යන අයගේ ඉල්ලීම වූයේ JM1-1 වැටුප් තලය විශ්වවිද්‍යාල පද්ධතිය යටතේ ගෙවනු ලබන වැටුප් තලයක් නොවන බවය. ඒ අනුව සාගර විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය වූ අය අතර හා අන්තර්ග්‍රහණය නොවූ අය අතර විශාල වැටුප් විෂමතාවයක් ඇති වී ඇත. එම නිසා සාගර විශ්වවිද්‍යාලය පාලන අධිකාරියෙන් එම්. එම්. මොහාන් ඇන්තනී යන අය ඉල්ලා සිටියේ තමන්ව JM1-1 වැටුප් තලයට සමාන විශ්වවිද්‍යාල පද්ධතිය යටතට වැටෙන U-Ex-1 වැටුප් තලයේ පිහිටුවන ලෙසටය.

2. ඊ. කේ. ඒ. සිසිර

වර්ෂ 1996.11.15 වන දින දී ධීවර අමාත්‍යාංශයේ ජාතික ධීවර පුහුණු අභ්‍යාස ආයතනයේ නැවියෙක් ලෙස සේවය කර ඇත. ඉන් අනතුරුව ජාතික ධීවර පුහුණු අභ්‍යාස ආයතනයේම ඊ. කේ. ඒ. සිසිර යන අය යාත්‍රාපති තනතුරට උසස්වීමක් ලබා ඇත.

1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතන පනත ක්‍රියාත්මක වීම නිසා රජයේ සේවයෙන් එනම් ජාතික ධීවර පුහුණු අභ්‍යාස ආයතනයෙන් විශ්‍රාම ගොස් ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සේවකයෙක් බවට පත්වී ඇත. ඉන් අනතුරුව වර්ෂ 2000.12.20 වන සිට යාත්‍රාපති තනතුරට පත් වී ඇත. එසේ සේවය කරමින් සිටියදී 2012 වසරේ දී යාත්‍රාපති පළමුවන (1) ශ්‍රේණියට පත් වී ඇති අතර එම තනතුර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් විය.

ඉන් අනතුරුව වර්ෂ 2015.06.17 වන දින අනතුරුව ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය, 2014 අංක 31 දරන පනත මගින් සාගර විශ්වවිද්‍යාලය බවට පරිවර්තනය වී ඇත. ඒ අනුව ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ හිටපු සේවකයන් සාගර විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කර ඇත.

ඊ.කේ.ඒ. සිසිර යන අය දැරූ තනතුරුවලම සේවය කර ඇත. ඒ අනුව ඊ.කේ.ඒ. සිසිර යන අයට යාත්‍රාපති තනතුරේම UMTI-1 වැටුප් කේතය යටතේ වැටුප් ලබා දී ඇත. ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සේවය කිරීමේදී ලැබූ JM1-1 වැටුප් කේතය වැනි විධායක ශ්‍රේණි වැටුප් කේතයක් නොවීය. ඒ සම්බන්ධයෙන් පාලන අධිකාරිය ඊ.කේ.ඒ. සිසිර යන විසින් දැනුවත් කර ඇත.

ඉන් අනතුරුව සාගර විශ්වවිද්‍යාලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් හා අනුමැතිය මත ඊ.කේ.ඒ. සිසිර යන අයට යාත්‍රාපති තනතුරේම JM1-1 වැටුප් කේතය යටතේ පළමුවන ශ්‍රේණියේ වැටුපක් ලබා දී ඇත.

නමුත් ඊ.කේ.ඒ. සිසිර යන අයගේ ඉල්ලීම වූයේ JM1-1 කේතය විශ්වවිද්‍යාල පද්ධතිය යටතේ ගෙවනු ලබන වැටුප් කේතයක් නොවන බවය. ඊ.කේ.ඒ. සිසිර යන අය ඉල්ලා සිටියේ තමන්ව JM1-1 වැටුප් කේතයට සමාන විශ්වවිද්‍යාල පද්ධතිය යටතට වැටෙන U-Ex-1 වැටුප් කේතයේ පිහිටුවන ලෙසටය.

3. ඩබ්.පී. ආරියදාස

වර්ෂ 1983.11.01 ජාතික ධීවර පුහුණු අභ්‍යාස ආයතනයේ නැවියෙක් ලෙස සේවයට බැඳී ඇත. ඉන් පසුව ඩබ්.පී. ආරියදාස යන අයට එම ආයතනයේම 1996.12.20 වන දින යාත්‍රාපති තනතුරට උසස්වීමක් ලැබී ඇත.

එසේ සේවය කරමින් සිටින අතරතුර 1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතන පනත ක්‍රියාත්මක වීම නිසා ජාතික ධීවර පුහුණු අභ්‍යාස ආයතනයේ සේවයෙන් විශ්‍රාම ගොස් ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සේවකයෙක් බවට පත්වී, 1999.12.20 වන දින සිට නැවියෙක් ලෙස සේවය කර ඇත. ඉන් පසුව ඩබ්.පී ආරියදාස යන අයට උසස්වීමක් ලැබී ඇත. අනතුරුව එම ආයතනයේ යාත්‍රාපති පළමුවන ශ්‍රේණියට (1) උසස් වීමක් ලැබී ඇත.

ඒ අනුව ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ යාත්‍රාපති JM1-1 වැටුප් තලයේ පළමුවන ශ්‍රේණියට අදාළ මාණ්ඩලික ශ්‍රේණියට අදාළ වැටුපක් ලබා ඇත.

එසේ සේවය කරමින් සිටින අතරතුර දී වර්ෂ 2014 දී, 2014 අංක 31 දරන සාගර විශ්වවිද්‍යාල පනත මගින් සාගර විශ්වවිද්‍යාලය පිහිටුවීමට රජය විසින් කටයුතු කර ඇත. ඒ අනුව ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ හිටපු සේවකයන් සාගර විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කර ඇත.

ඒ අනුව ඩබ්.පී. ආරියදාස යන අයට යාත්‍රාපති තනතුරේම UMT1-1 වැටුප් කේතය යටතේ වැටුප් ලබා දී ඇත. එය JM1-1 වැටුප් කේතය වැනි මාණ්ඩලික මට්ටමේ වැටුප් කේතයක් නොවීය.

ඒ සම්බන්ධයෙන් සාගර විශ්වවිද්‍යාල පාලන අධිකාරිය ඩබ්.පී. ආරියදාස යන අය විසින් දැනුවත් කර ඇත. ඉන් අනතුරුව සාගර විශ්වවිද්‍යාලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් හා අනුමැතිය මත ඩබ්. පී. ආරියදාස යන අයට යාත්‍රාපති තනතුරේම පළමු ශ්‍රේණියේ (1) JM1-1 වැටුප් කේතය යටතේ ලබා දී ඇත. ඩබ්.පී. ආරියදාස යන අය එසේ සේවය කරමින් සිටින අතරතුර වර්ෂ 2018.04.13 විශ්‍රාම ගොස් ඇත.

නමුත් විශ්‍රාම යන තෙක් ඩබ්. පී. ආරියදාස යන අයගේ ඉල්ලීම වූයේ JM1-1 වැටුප් කේතය විශ්වවිද්‍යාල පද්ධතිය යටතේ ගෙවනු ලබන වැටුප් කේතයක් නොවන බැවින් තමන්ව JM1-1 වැටුප් කේතයට සමාන විශ්වවිද්‍යාල පද්ධතිය යටතට වැටෙන U-Ex - 1 වැටුප් කේතයේ පිහිටුවන ලෙසටය.

නමුත් මෙම පළමු පාර්ශ්වයන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් සාගර විශ්වවිද්‍යාල පාලන අධිකාරිය ප්‍රතිචාර නොදැක්වීම මත මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයන් මේ පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කරන ලදී. එහිදී ද මෙම ආරාවුල නිරවුල් කිරීමට නොහැකි වීම මත බේරුම්කරණය මගින් විසඳා අවසන් තීරණයක් ලබා දීම සඳහා බේරුම්කරණ විනිශ්චය සභාව වෙත යොමු කර ඇත.

සාක්ෂි විශ්ලේෂණය

මෙම ආරාවුල විමසීමට ගත් පළමු අවස්ථාවේ ඩබ්.පී. ආරියදාස යන අයගේ සාක්ෂිය පළමුව මෙහෙයවීම සිදු කරන ලද අතර එම සාක්ෂි විමසීම අවසාන වනවාත් සමගම මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබා දීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් පැමිණි මොහාන් දීපලාල් සමරවීර යන අයගේ සාක්ෂි විමසීම ආරම්භ කරන ලදී.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් පැමිණි මොහාන් දීපලාල් සමරවීර යන අයගේ සාක්ෂි මෙහෙයවීම සිදු කරගෙන යන අතරතුර එනම් වර්ෂ 2022 පෙබරවාරි මස 25 වන දින දෙවන පාර්ශ්වීය ආයතනය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරිය බේරුම්කරණ විනිශ්චය සභාවට දන්වා සිටියේ, සාගර විශ්වවිද්‍යාල පනතේ 39 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවා ඇති අභියාචන මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම ඉල්ලුම්කරුවන්ව UEx1 දරණ වැටුප් කේතයේ හා (11) දෙවන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට තීරණය කර ඇති බවය. එදින පළමු පාර්ශ්වයන් විසින් එකඟතාවයද පළ කරන ලදි.

මුල් අවස්ථාවේ දී UEx1-11 දරන වැටුප් කේතයේ හා දෙවන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධයෙන් පළමු පාර්ශ්වයන් එකග වුවද, නැවත මෙම ආරාවුල බේරුම්කරණ විනිශ්චය සභාව විසින් මෙම අන්තර්ග්‍රහණය සම්බන්ධයෙන් වූ ක්‍රියාවලිය නිසි ආකාරයෙන් සිදු වුවාද යන්න විමසා බැලීමට කැඳවූ අවස්ථාවිදී මෙම අරාවුලට අදාළ පළමු පාර්ශ්වයන් විසින් විනිශ්චය සභාවට දන්වා සිටියේ UEx1 යන වැටුප් කේතයට අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධයෙන් විරෝධතාවයක් නොමැති බවත්,නමුත් මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයන් පළමු (1) වන ශ්‍රේණියේ සිටි සේවකයන් බැවින් දෙවන (II) ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධයෙන් මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයන් එකඟ නොවන බවත්, එම නිසා මෙම ආරාවුල විභාග කිරීමෙන් අනතුරුව මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයන්ට අදාළව නිවැරදි ශ්‍රේණියක පිහිටුවීමට නියෝගයක් ලබා දෙන ලෙසත්ය.

පළමු පාර්ශ්වයේ කරුණු දැක්වීම මත බේරුම්කරණ විනිශ්චය සභාවට නිරීක්ෂණය වුයේ සාගර විශ්වවිද්‍යාලයේ අභියාචනා මණ්ඩලය තීරණය නොකළ ශ්‍රේණියක මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වයන් අන්තර්ග්‍රහණය කිරීමට දෙවන පාර්ශ්වීය ආයතනය වන සාගර විශ්වවිද්‍යාලය නිසි බලතල සහිත ආයතනයකින් (කළමනාකරණ සේවා කොමිෂන් සභාවෙන් හෝ වැටුප් හා සේවක සංඛ්‍යා නිර්ණය කොමිෂන් සභාවෙන්) නිසි අවසර ලබා ගැනීමකින් තොරව තීරණය කර ඇති බවත්, මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වයන් දෙවන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළහොත් ඒ මත මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වයන් ශ්‍රේණියෙන් පහත හෙළීමක් සිදුවන බවත්ය.

දෙවන ශ්‍රේණියට (II) මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වයන් අන්තර්ග්‍රහණය කිරීමට තීරණය කිරීම නිවැරදි බවට එය ඔප්පුවන ආකාරයෙන් කිසිදු පිළිගත හැකි කරුණු දැක්වීමක් කිරීමට දෙවන පාර්ශ්වීය ආයතනය ක්‍රියා නොකිරීම මතද, මෙම ආරාවුලට අදාළව තවත් ආරාවුලක් ඉතිරි කර මෙම ආරාවුල අවසන් කිරීමට බේරුම්කරණ විනිශ්චය සභාවට නොහැකි බැවින්ද, එසේම මෙම ආරාවුලට අදාළව තවත් ආරාවුලක් ඉතිරි කලහොත් එම ආරාවුලෙන් අගතියට පත් පාර්ශ්වයන් නැවත වරක් කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කර දීර්ඝ ක්‍රියාවලියක් පසු කර තම ප්‍රශ්ණය විසඳා ගත යුතු බැවිනුත්, සාගර විශ්වවිද්‍යාල පනත මගින් පිහිටු වන ලද අභියාචන මණ්ඩලය විසින් මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයන් UEx1 වැටුප් තලයට අන්තර්ග්‍රහණය කිරීමට අවසන් තීරණයක් ලබා දුන්නද, සාගර විශ්වවිද්‍යාලයේ අභියාචනා මණ්ඩලය විසින් තීරණය නොකළ දෙවන (II) ශ්‍රේණියට මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයන් අන්තර්ග්‍රහණය කිරීමට සාගර විශ්වවිද්‍යාලය තීරණය කිරීම තුලින් නැවත ආරාවුලක් නිර්මාණය කර ඇති බැවිනුත්, මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයන්ට එමගින් අසාධාරණයක් සිදු වී ඇති බැවිනුත්, මෙම ආරාවුල විභාග කර අවසන් නියෝගයක් ලබාදීමට බේරුම්කරු වශයෙන් මා හට ඇති බලතල ප්‍රකාරව මා තීරණය කළ අතර එය කිසිසේත්ම අභියාචනා මණ්ඩල තීරණය අභිබවා යාමක් නොවේ.

ඒ අනුව දෙපාර්ශ්වයෙන්ම සාක්ෂි විමසීම සිදු කරන ලද අතර මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය P1 සිට P37 දක්වා ලේඛන ලකුණු කරමින් ද, දෙවන පාර්ශ්වය R1 සිට R22 දක්වා ලේඛන ලකුණ කරමින් ද දෙපාර්ශ්වයේම සාක්ෂි මෙහෙයවීම අවසන් කරන ලදී. ඒ අනුව දෙපාර්ශ්වය විසින්ම ලිඛිත දේශන ගොනු කරන ලදී.

ඒ අනුව බේරුම්කරු වශයෙන් පළමුව මා සලකා බැලීමට තීරණය කළේ මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වයන් ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සේවය කරන විට ඔවුන් සමග එකම වැටුප් කේතයක හා කාණ්ඩයක සිටිය සේවකයන් කවුරුන්ද යන්න හා ඒ අයට සාගර විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය වීමේදී ලබා දී ඇති වැටුප්තල හා ශ්‍රේණි මොනවාද යන්නයි.

ඒ අනුව මෙම ආරාවුලට අදාළව පළමු පාර්ශ්වයන් විසින් මෙම ආරාවුලට සාක්ෂි මෙහෙයවීම සිදු කරන අතරතුර සලකුණු කරන ලද P2 දරන ලේඛනයේ පරිදි JM1-1 වැටුප් තලයට අදාළව JUNIOR MANAGER යන කාණ්ඩය යටතේ තනතුරු දැරූ අයට සාගර විශ්වවිද්‍යාලය තුළ තමා දරන ලද තනතුරට අදාළ ශ්‍රේණිය කිසිසේත්ම පහත හෙළීමක් කර නොමැති අතර ඔවුන් විසින් දරන ලද තනතුරට අදාළ ශ්‍රේණියම හෝ ඊට වඩා ඉහළ ශ්‍රේණියක් ලබා දී ඇත. කිසිසේත්ම පහත හෙළීමක් කර නොමැත. ඒ බව තනතුරු දරන්නන්ට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති පළමු පාර්ශ්වය විසින් ප්‍රතිඋත්තරය මගින් ගොනු කර ඇති ඇමුණුම් අංක 04 අනුව තහවුරු වේ.

තවද පළමු පාර්ශ්වය විසින් සාක්ෂි මෙහෙවන අතරතුර සලකුණු කරන ලද P16 ලෙස සලකුනු කරන ලද සාගර විශ්ව විද්‍යාල පනත මගින් පිහිටුවන ලද අභියාචනා මණ්ඩලය විසින් ලබා දී ඇති අවසන් තීන්දුවේ අංක 6 යටතේ සඳහන් කොටසේ දක්වා ඇති කාර්මික නිලධාරීන් JM1-1 වැටුප් තලයට අදාළ දෙවන (II) ශ්‍රේණියේ සේවය කරන ලද සේවකයන් සාගර විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රණය කිරීමේදී UMT- 1 වැටුප් තලයේ තුන්වන (III) වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම තුළින් කණිෂ්ට කළමනාකරන මට්ටමේ තනතුරු දරමින් සිටි තමත් ද්වීතීයික මට්ටමේ කලමනාකරණ සහායක තාක්ෂණ කාණ්ඩය දක්වා පහත හෙළා ඇති බැවින්, ඔවුන්ට හිමිව තිබූ වරප්‍රසාද හා ජ්‍යෙෂ්ඨත්වය අහිමි වී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 70 (2) වගන්තිය ද උල්ලංඝණය වී ඇති බැවින් ඔවුන්ට UEX-1 හි 2 ශ්‍රේණිය ලබා දෙන ලෙසත්ය.

ඒ අනුව තහවුරු වන්නේ කුමන හෝ සේවකයකු සිටි ශ්‍රේණියට වඩා පහළ ශ්‍රේණියක් ලබා දීමට හැකියාවක් නොමැති බවත්ය. තවද කිසිසේත්ම අභියාචනා මණ්ඩලය වැටුප් කේතය පමණක් ලබා දී එම වැටුප් කේතය තුළ මෙම ආරාවුලට අදාළ පුද්ගලයන් පිහිටුවීමට තීරණයක් ලබා දී ඇත්තේ මෙම ආරාවුලට අදාළ පුද්ගලයන් ඔවුන් සිටි ශ්‍රේණියට වඩා පහළ ශ්‍රේණියක පිහිටු වීමට නොවන බවට මෙයින් මනාව තහවුරු වේ.

දෙවනුව බේරුම්කරු වශයෙන් මා සලකා බැලීමට තීරණය කළේ පළමු පාර්ශ්වය UEX-1 වැටුප් කෝතයේ පිහිටුවීමේදී, මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වයන් නියමිත වැටුප් පරිමාණයේ පිහිටුවා ඇති යන්න සලකා බැලීමයි.

ඒ අනුව මෙම ආරාවුල මෙම බේරුම්කරණ විනිශ්වය සභාවේ විමසීමට ගන්නා ලද අවස්ථාවේ මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබා දීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් පැමිණි මොහාන් දීපලාල් සමරවීර යනඅය ලබා දුන් පහත දිනවලට අදාළ සාක්ෂි සලකා බැලීමට තීරණය කළෙමි. ඒ අනුව

*වර්ෂ 2021.04.23 වන දින ලබා දුන් සාක්ෂිය (පිටු අංකඃ29) පහත පරිදි වේ.*

ප්‍රඃ එතකොට මේ ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය JM1-1 වැටුප් ලබපු කෙනෙක් මේ 4/2016 අනුව වැටුප් ලබනව නම් ඔහුට හිමි වෙන්න ඕනේ මොන වැටුප් කේතයද?

පිඃ මේක සංසන්දනය කරලා නැහැ.

ප්‍රඃ මම අහන්නේ ජුනියර් මැනේජර් තනතුරට අදාළව?

පිඃ ජුනියර් මැනේජර් තනතුරට අදාළව යම්තාක් දුරට වර්ග කළ හැකි මට්ටම UEX-1 ඒක තමයි යම්තාක් දුරට කළ හැකි මට්ටම.

*වර්ෂ 2022.11.04 වන දින ලබා දුන් සාක්ෂිය (පිටු අංක ඃ2) පහත පරිදි වේ.*

(සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වා සිටී)

ප්‍රඃ මේ ලේඛනය කුමක්ද?

පිඃ අන්තර්ග්‍රහණය කිරීම පිළිබඳ සහතික කිරීම

ප්‍රඃ මෙම ලේඛනය අනුව මොහාන් ඇන්තනී මහතාට වැටුප් ප්‍රතිශෝධනය කිරීමට පෙර අවසන් වශයෙන් ලබා දී ඇති වැටුප කීයද?

*වර්ෂ 2022.11.04 වන දින (පිටු අංක 2)*

පිඃ JM වැටුප් කාණ්ඩය රු. 30,775.00

ප්‍රඃ නව වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප කීයද?

පිඃ රු 32,290.00

ප්‍රඃ මෙම ලේඛනය අනුව ඊ.කේ.ඒ.සිසිර මහතාට වැටුප් ප්‍රතිශෝධනය කිරීමට පෙර අවසන් වශයෙන් ලබා දී ඇති වැටුප කීයද?

පිඃ රු 30,225.00

*වර්ෂ 2022.11.04 වන දින (පිටු අංක 3)*

ප්‍රඃ නව වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප කීයද?

පිඃ රු 31000.00

ප්‍රඃ මෙම ලේඛනය අනුව ඩබ්.පී.ආරියදාස මහතාට වැටුප් ප්‍රතිශෝධනය කිරීමට පෙර අවසන් වශයෙන් ලබා දි ඇති වැටුප කීයද?

පිඃ රු 31,875.00

ප්‍රඃ නව වැටුප් පරිමාණයේ ආර්මභක වැටුප කීයද?

පිඃ රු 33,580.00

*වර්ෂ 2022.11.04 වන දින නැවත ප්‍රශ්න (පිටු අංක 4)*

ප්‍රඃ තමා හරස් ප්‍රස්න වලට පිළිතුරු දෙමින් කියා සිටියා R 12 (a) ලේඛනයේ 4:5 වගන්තිය අනුව ප්‍රතිශෝධනය කිරීමේදී අවසාන වශයෙන් ලැබූ වැටුප නව වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට වඩා අඩුනම් ඔහු නව වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපේ තැබිය යුතුයි කියලා.

පිඃ ඔව්

*වර්ෂ 2022.11.04 වන දින නැවත ප්‍රශ්න (පිටු අංක : 05)*

ප්‍රඃ එම්.එම්. මොහාන් ඇන්තනී ඊ. කේ.ඒ. සිසිර සහ ඩබ්.පී.ආරියදාස මහතාට 2015.06.17 වන දිනෙන් පසුව UEX - 1 වැටුප් කේතය යටතේ ගෙවන ලද වැටුප පිළිබඳව හරස් ප්‍රශ්නවලට පිළිතුරු දුන්නා?

පිඃ ඔව්

ප්‍රඃ 04/2016 චක්‍ර ලේඛනයේ UEX - 1 වැටුප් කේතය යටතේ ඇති ආරම්භක වැටුප් පරිමාව කීයද?

පිඃ රු 49,860.00

ප්‍රඃ R13 ලේඛනය අනුව ඒ තුන්දෙනාගෙන් එක්කෙනෙක්වත් එම ආරම්භක වැටුපෙහි පිහිටුවා තිබේද?

පිඃ R13 ලේඛනයේ සඳහන් වන ආකාරයට ආරම්භක වැටුපේ පිහිටුවා ඇති බවත් නිරීක්ෂණය වන්නේ නැහැ

*වර්ෂ 2022.11.04 වන දින නැවත ප්‍රශ්න (පිටු අංක :7)*

ප්‍රඃ පැ 11(P11) ලේඛනය අනුව UEX - 1 වැටුප් කේතය යටතේ JUNIOR MANAGER ට අදාළ වැටුප් පරිමාණය කීයද ?

පිඃ UEX - 1 ආරම්භක වැටුප රු 49,860.00 - 3x1125 - 21 x 1240 - 79275

මෙම වාචිකමය සාක්ෂි හා ලේඛනමය සාක්ෂි අනුව පැහැදිලි වන්නේ මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වය UEX - 1 වැටුප් කේතය යටතේ නියමිත වැටුප් පරිමාණයේ පිහිටුවීමට සාගර විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අංශය ක්‍රියාකර නොමැති බවකි.

තෙවනුව බේරුම්කරු වශයෙන් මා සලකා බැලීමට තීරණය කළේ පළමු පාර්ශ්වයන් UEX - 1 වැටුප් කේතයේ පිහිටුවීමේදී සාගර විශ්වවිද්‍යාලය විසින් මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයන් නියමිත වැටුප් චක්‍රලේඛනය මත පිහිටුවා ඇතිද යන්න සලකා බැලීමයි.

ඒ අනුව පළමුව බේරුම්කරණ විනිශ්චය සභාවේදී පළමු පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබා දීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් පැමිණි සමරවීර මුදලිගේ මොහාන් දීපලාල් සමරවීර යන අය ලබා දුන් පහත දින වලට අදාළ සාක්ෂි සලකා බැලීමට තීරණය කළෙමි. ඒ අනුව

*වර්ෂ 2022.08.30 වන දින ලබා දුන් සාක්ෂි සටහන් (පිටු අංක : 4) අනුව පහත පරිදි වේ.*

ප්‍රඃ P12 ලේඛනයේ 02(I) සිට 02(V) දක්වා සඳහන් වන්නේ අන්තර්ග්‍රහණය කළ නොහැකි වූ නිලධාරීන් 41 දෙනා වෙත වැටුප් ගෙවීම පිළිබඳව අදාළ කරගත යුතු කොන්දේසි බව පිළිගන්නවාද?

පිඃ ඔව්

ප්‍රඃ එහි 02(v) ඡේදයේ සඳහන් වනවාද වැටුප් ගෙවිය යුත්තේ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සහ වැටුප් සම්බන්ධව අනුමත කර ඇති 4/2016 චක්‍රලේඛය අනුව බව?

පිඃ සඳහන් වෙනවා

P11 ලේඛනය සාක්ෂිකරුට පෙන්වා සිටී

ප්‍රඃ P11 ලෙස සඳහන් කර ඇත්තේ එම චක්‍රලේඛනයද?

පිඃ ඔව්

ප්‍රඃ P11 පළවන ඡේදයෙහි කියා තිබෙනවාද දැනට ක්‍රියාත්මක වන වැටුප් පරිමාණයන් වෙනුවට 04/2016 චක්‍රලේඛනයේ උපලේඛන 01 හි සඳහන් වැටුප් පරිමාණයන් අදාළ කර ගත යුතු බව?

පිඃ ඔව්

ප්‍රඃ ඉහත P11 උපලේඛන 1 හි සඳහන් වෙනවාද ජූනියර් එක්සෙකටිව්/ මැනේජර් තනතුරු සඳහා UEX - 1 - 2016 අදාළ කර ගත යුතු බව?

පිඃ සඳහන් වෙනවා

ප්‍රඃ UEX - 1 වැටුප් පරිමාණය ආරම්භ වන්නේ වැටුප රුපියල් කීයෙන්ද?

*වර්ෂ 2022.08.30 වන දින ලබා දුන් සාක්ෂි සටහන් (පිටු අංක 5) අනුව පහත පරිදි වේ.*

පි: රුපියල් 49,860.00 යි

ප්‍ර: එහි ඇති වැටුප් වර්ධක ප්‍රමාණය කීයද?

පි: 1125 න් 3 යි. 1240 න් 21 යි.

ප්‍ර: UEX - 1 - 2016 වැටුප් පරිමාණය උපරිම වැටුප කීයද?

පි: රුපියල් 79,275.00යි.

මෙම සාක්ෂි අනුව පැහැදිලි වන්නේ මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වය 4/2016 චක්‍රලේඛනය අනුව නියමිත වැටුප් පරිමාණයේ පිහිටු වීමට සාගර විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අංශය ක්‍රියාකර නොමැති බවකි.

අවසාන වශයෙන් බේරුම්කරු වශයෙන් මා සලකා බැලීමට තීරණය කළේ සාගර විශ්වවිද්‍යාලය කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් නියමිත අනුමැතිය ලබාගෙන මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයන් අභියාචන මණ්ඩල තීරණය අනුව නිවැරදි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර ඇතිද යන්න හා නිවැරදි ආකාරයෙන් අන්තර්ග්‍රහණ ලිපි නිකුත්කර ඇතිද යන්නයි.

ඒ අනුව සාගර විශ්වවිද්‍යාල වෙනුවෙන් සාක්ෂි ලබාදීමට පැමිණි සහකාර ලේඛකාධිකාරි (මානව සම්පත් ) යන අයගේ සාක්ෂිය මගින් තහවුරු වන්නේ මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයන්ට අදාළ ශ්‍රේණිය සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ හෝ සේවක සංඛ්‍යා නිර්ණය කොමිෂන් සභාවෙන් අනුමැතියක් හෝ මෙම අභියාචන මණ්ඩල තීරණය සම්බන්ධයෙන් ලබා නොගත් බවකි . නමුත් මෙම ආරාවුලට අදාළව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සාක්ෂි ලබාදුන් සමරවීර මුදලිගේ මොහාන් දීපලාල් සමරවීර යන නිලධාරිවරයා සාක්ෂි ලබා දී ඇත්තේ මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වයෙන් අන්තර්ග්‍රහණයට හා ඔවුන්ට ශ්‍රේණිය ලබා දීමට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා සේවක සංඛ්‍යා නිර්ණය කොමිෂන් සභාව දැනුවත් කර අවසර ලබා ගත යුතු බවකි. එම නිලධාරියා විසින් ලබා දී ඇති පහත දින දරණ සාක්ෂියෙන් මනාව සනාථ වේ.

*වර්ෂ 2022.09.28 වන දින ලබා දුන් සාක්ෂි සටහන් (පිටු අංක 27) අනුව පහත පරිදි වේ.*

ප්‍ර: මහත්මයා යම්කිසි අයකු ඔය කියන්නාවූ UEX 1 වැටුප් පරිමාණයට වඩා පහළ වැටුප් පරිමාණයක සිටි නම් ඉහල වැටුප් පරිමාණය වන UEX 1 වැටුප් පරිමාණය ලබාදීමේදී කුමන ශ්‍රේණියද මහත්මයා ලබා දෙන්නේ? එක ශ්‍රේණියද? දෙක ශ්‍රේණියද?

පි: ඒ කාරණය මෙතනදී කියන්න අපහසුයි. මොකද පුද්ගලයෙක් UEX 1 වැටුප් පරිමාණයට යනවා නම් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට හැර වෙනත් කාටවත් තීරණය කරන්න බැහැ.

ප්‍ර: ඒ අනුව එලෙස මාරුවීමක් වෙනවා නම් මහත්මයා ඔබ කියන්නේ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතුද?

පි: යම් කිසි STEP එකක් දෙනවා මේක අපට දෙවන ශ්‍රේණියද පළවන ශ්‍රේණියද කියලා තහවුරු කරන්න කාටවත් හැකියාවක් නැහැ. ඒ අය තමයි තීරණය කරන්නේ ඒ වෙන වැටුපත් එක්ක අනිත් වැටුප් කණ්ඩායමට මාරු කිරීමේදී මොන STEP එකේද තියන්නේ කියලා.

දෙවන ශ්‍රේණිය ලබා දුන් ආකාරය සම්බන්ධයෙන් සාගර විශ්වවිද්‍යාලය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් සහකාර ලේඛකාධිකාරි (මානව සම්පත්) යන අයගේ සාක්ෂි ලබා දීමේදී තමා ගත් ක්‍රියාමාර්ගය පමණක් සඳහන් කරන අතර එහිදී මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයන්ගේ ආරම්භක වැටුප හා අවසාන වැටුප සම්බන්ධ කරගෙන මෙම ශ්‍රේණිය තීරණය කළ බව එම නිලධාරියාගේ සාක්ෂිය පුරාවටම සාක්ෂි ලබා දී ඇත.

නමුත් එය විනිශ්චය සභාවකට පිළිගත හැකි ආකාරයේ ගණනය කිරීමක් කර පෙන්වීමට සාගර විශ්වවිද්‍යාලය වෙනුවෙන් සාක්ෂි ලබා දුන් නිලධාරියා අසමත් වීමක් නොව එය එම නිලධාරියා විසින් හිතාමතාම පැහැර හැර ඇති බව නිරීක්ෂණය වේ.

එම පැහැර හැරීම තවදුරටත් තහවුරු වන්නේ බේරුම්කරු වශයෙන් මා දුන් නියෝගය පරිදි මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයන් UEX 1 පළමුවන (I) ශ්‍රේණියට හා UEX 1 දෙවන (II) ශ්‍රේණියට 2015.06.17 වන දින සිට අන්තර්ග්‍රහණය කළේ නම් ඔවුන්ට අදාළ හිඟ වැටුප් කොපමණද යන්න හා මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයන් UEX 1 පළමුවන (I) ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළේ නම් එම වැටුප් කේතයට හා ශ්‍රේණියට අදාළ වැටුප් තලය බේරුම්කරණ විනිශ්චය සභාවට ලිඛිතව දන්වන ලෙස දුන් නියෝගයට එවන ලද වාර්තාව කිසිදු විනිවිද භාවයක් නොමැති ගණනය කළ ආකාරය දක්වා නොමැති වැටුප් කේතය නිවැරදිව දැක්වීමක් නොකරන ලද ලේඛනයකි. එම සියලු ලිපි ලේඛන අත්සන්කර එවා ඇත්තේද ආයතනයේ ගිණුම් අංශය නොව මෙම ආරාවුලට අදාළ දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් සහාකාර ලේඛකාධිවරයාය.

තවද P 30 හා R 18 දරන මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයන්ට නිකුත්කර ඇති අන්තර්ග්‍රහණ ලිපි දෝෂ ලෙස නිකුත්කර ඇත. එම අන්තර්ග්‍රහණ ලිපි ප්‍රකාරව අංක 02 යටතේ පහත ආකාරයට දක්වා ඇත.

"2015.06.17 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔබ යාත්‍රාපති තනතුරේ UEX 1 (II) Rs. 26,020 -3x 585 - 27,775 (EB) - 28,420 - 12 x 645 - 36,160 p. m වැටුප් කේතයේ සහ වැටුප් පරිමාණයෙහි පිහිටුවනු ලබන අතර එදිනට ඔබගේ වැටුප රු. 32,290/- ක් වනු ඇත. එසේම 2020.01.01 දින සිට ඔබට අදාළ මාසක වැටුප් ක්‍රමය UEX 1 -2016A , Rs.50,625 - 3 x 1,125 - 21 x 1,335 - 82,035 p.m වන අතර වර්තමාන මාසික වැටුප රු. 74,025 ක් වේ."

නමුත් UEX 1 (II) Rs. 26,020 - 03x 585 - 27,775 (EB) 28,420 - 12645 x 36,160 p.m වැටුප් කේතයේ සහ වැටුප් පරිමාණයෙහි මෙම ආරාවුලට අදාළ පාර්ශ්වයන් අන්තර්ග්‍රහණය කළද 2020.01.01 දින සිට P18 C ලේඛනය අනුව මාසික වැටුප් ක්‍රමය විය යුත්තේ UEX 1 -2016 A Rs. 50,625 - 3 x 1.125 - 54000 (EB) 55335 ; 12 x 1,335 - 71355 p.m විය යුතු අතර නමුත් අන්තර්ග්‍රහණ ලිපියේ සඳහන් වෙන්නේ P18 C ලේඛනය අනුව UEX 1 -2016A , Rs.50,625 - 3 x 1,125 - 21 x 1,335 - 82,035 p.m යනු UEX 1 (I) එනම් පළමු ශ්‍රේණියට අදාළ වැටුප් පරිමාණයකි මෙම ආරාවුලට අදාළ පුද්ගලයන්ට දෝෂ සහගත ලෙස මෙසේ අන්තර්ග්‍රහණ ලිපි නිකුත් කලද මෙම ආරාවුලට සම්බන්ධයක් නොමැති පුද්ගලයෙකුවන R 22 ලෙස සලකුණු කර ඇති අන්තර්ග්‍රහණ ලිපි නිකුත් කල පුද්ගලයාට නිවැරදි වැටුප් පරිමාණ සහිතව එම ලිපිය නිකුත් කර ඇති බව P18 C ලේඛනය අනුව තහවුරු වේ.

ඒ අනුව තහවුරු වන්නේ සාගර විශ්වවිද්‍යාලය විසින් ශ්‍රේණිය මෙම ආරාවුලට අදාළ පුද්ගලයන්ට ලබා දීමේදී නිසි ක්‍රමවේද අනුගමනය නොකර අත්තනෝමතික ලෙස ක්‍රියාකර ඇති බවත් අන්තර්ග්‍රහණ ලිපි පවා නිකුත් කිරීමේදි වගකීම් විරහිත ලෙස හා පසුවිපරම් කිරීමකින් තොරව ක්‍රියා කර ඇති බවය.

තවද මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වයට අයත් සියලු පුද්ගලයින්ගේ සාක්ෂි තුළින් තහවුරු වන්නේ ඔවුන් දෙවන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම තුළින් තමා යටතේ සිටින අනෙක් සේවකයන් තමන්ට වඩා ඉහළ ශ්‍රේණියක සිටීම මත ඔවුන් සමඟ රාජකාරී කටයුතු කිරීමේදී විශාල අර්බුද රාශියකට මුහුණ දීමට සිදුවන බවය. එම තත්වය එසේ නොවන බව තහවුරු කිරීමට දෙවන පාර්ශ්වීය ආයතනය මඟින් සාක්ෂි ඉදිරිපත් කිරීමක් කර නොමැත.

අවසාන වශයෙන් මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය විසින් P16 ලෙස සලකුණු කරන ලද සාගර විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලය විසින් ලබා දුන් තීන්දුව කෙරෙහි අවධානය යොමුකිරීමේදී පෙනී යන්නේ යම් නිලධාරියකු මාණ්ඩලික මට්ටමේ නිලධාරියකුව සිටියේ නම් විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කළ යුත්තේ මාණ්ඩලික මට්ටමේ තනතුරකට බවට අභියාචන මණ්ඩලය තීරණය කර ඇත. එම නිසා යාත්‍රාපති තනතුර දරන්නාට පුද්ගලික වනසේ UEX 1 වැටුප් කේතය යටතේ අන්තර්ග්‍රහණය කළ යුතු බවට අභියාචනා මණ්ඩලය තීරණය කර ඇත.

ඒ අනුව මෙම ආරාවුලට අදාළ පුද්ගලයන් UEX 1 දෙවන (II) ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම තුළින් ඔවුන් සිටි පළමු ශ්‍රේණියෙන් පහත හෙළීමක් වන අතර එය තෘතීය මට්ටමේ සිට ද්විතියික මට්ටමට පහත වැටීමකි. තනතුර පහත හෙළීමට තරම් අකටයුතු කම් රාජකාරියට අදාළව ඔවුන් කර ඇති බවක් මෙම ආරාවුලට අදාළව ඉදිරිපත්වී ඇති සාක්ෂි මගින් තහවුරු නොවේ.

ඒ අනුව ඉදිරිපත්වී ඇති සියලු සාක්ෂි හා ලේඛන සලකා බැලූ අතර ඒ අනුව මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයට සාගර විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණ කිරීමේ මූලික අවස්ථාවේ සිට අභියාචන මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම දක්වා වූ කාල සීමාව දක්වා ඔවුන්ව වෙනස්කොට සැලකීමකට හා අසාධාරණකම්වලට ලක් වී ඇති බව සාගර විශ්වවිද්‍යාලයේ ආයතනික ක්‍රියාදාමය සැලකිල්ලට ගනීමේදී තහවුරු වේ.

එම නිසා UEX 1 වැටුප් කේතයේ දෙවන (II) ශ්‍රේණියේ මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වයන් සාගර විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීම තුළින් සාගර විශ්වවිද්‍යාල පනතේ 70(2) වගන්තිය උල්ලංඝණය වී ඇති බව තහවුරු වේ ඒ අනුව මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වයට අයත් සේවකයන් තිදෙනාම යත්‍රාපති තනතුරේ UEX 1 (I) පළමු ශ්‍රේණියට Rs. 32935 - 3 x 645 - 41320 p. m. වැටුප් කේතය හා වැටුප් පරිමාණයෙහි පිහිටුවා 14 වන වැටුප් පියවරට අන්තර්ග්‍රහණය කරන ලෙසට ප්‍රදානය ලබාදෙමි . තවද මෙම ශ්‍රේණියට අදාළ යම් දීමනා තිබෙන බව සාගර විශ්වවිද්‍යාලය ගණනය කිරීමේදි දක්වා නොමැති බැවින් යම් වැටුපට අමතරව යම් දීමනාවක් මෙම යත්‍රාපති තනතුරේ UEX 1 (I) පළමු වන ශ්‍රේණියට අදාළ වේනම් එයද මෙම හිඟ වැටුප් ගෙවීමේදී ගෙවිය යුතුය.

තවද මෙම සේවකයන්ට හිමි හිඟ සේවක වැටුප් සම්බන්ධයෙන් ගෙවිය යුතු හිඟ වැටුප් ප්‍රමාණය තහවුරු කළ යුතුව තිබුණේ ගිණුම් අංශයේ නිලධාරියකු වුවද එය ගණනය කර එය නිවැරදි බවට තහවුරු කර ඇත්තේ මෙම ආරාවුලට අදාළව සාක්ෂි ලබා දුන් සහකාර ලේඛාධිකාරි විසින් බැවින් මෙම ගෙවීම් යම් දෝෂ සහගත තත්වයක් තිබුණහොත් එය නිවැරදි කර දීමට සාගර විශ්වවිද්‍යාලය බැඳී සිටින බව නියෝග කරමින් අයතනය විසින් ගණනය කර එවා ඇති ලේඛනය අනුව

| | |
|---|---|
| එම්.එම්.මොහාන් ඇන්තනී | - රු. 348,488.62 |
| ඊ.කේ.ඒ.සිසිර | - රු. 595,097.55 |
| ඩබ්.පී.ආරියදාස | - රු. 58,963.29 |

ඩබ්.පී. ආරියදාස යන අය විශ්‍රාම ගොස් ඇති බැවින් ඔහුට ගෙවීමට නියමිත රුපියල් පනස් අටදහස් නවසිය හැට තුනයි. සත විසිනවයක මුදල මෙම ප්‍රදානය *ගැසට්* කර මාස හයක් ඇතුළත කොළඹ කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු අතර එම්. එම්. මොහාන් ඇන්තනී හා ඊ.කේ.ඒ.සිසිර යන අයගේ මුදල් මෙම ප්‍රදානය *ගැසට්* කර මාස හයක් ඇතුලත ගෙවා අදාළ මුදල් ගෙවූ බවට මෙම ආරාවුලේ දෙපාර්ශ්වය විසින්ම ඒ බව උතුරු කොළඹ කම්කරු කොමසාරිස් වෙත වාර්තා කළ යුතු බවට මෙයින් නියෝග කරමි. තවද මෙම ආරාවුලට අදාළ ව්‍යවස්ථාපිත දීමනා සම්බන්ධයෙන් ඒවාට අදාළව ක්‍රියාකිරීමට ව්‍යවස්ථාපිත ආයතන පවතින බැවින් ඒ සම්බන්ධයෙන් නියෝගයක් ලබා නොදෙමි.

තවද මෙය කිසිසේත්ම සාගර විශ්වවිද්‍යාලයේ අභියාචන මණ්ඩලය විසින් ලබාදුන් නියෝග අභිබවා යාමක් නොවන අතර සාගර විශ්වවිද්‍යාලයේ අභියාචන මණ්ඩලය විසින් දුන් නියෝගය ප්‍රකාරව නිසි ක්‍රමවේද අනුගමනය නොකර අත්තනෝමතිකව සාගර විශ්වවිද්‍යාලය ක්‍රියාකිරීම නිසා සේවකයන්හට සිදුවී තිබෙන අසාධාරණ සාධාරණ හා යුක්ති සහගත මූලධර්මය යටතේ නිරාකරණය කිරීමකි.

ඉහත කාරණා හේතුවෙන් මෙම ප්‍රදානය කාර්මික නීතියේ ඉහලින් පිළිගැනෙන සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බවට තීරණය කරමි.

**කේ. කුමුදු කුමාරි ධනපාල**
බේරුම්කරු

2024 අප්‍රේල් මස 01 වැනි දීය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.